සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) (1) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වායාමයට අයත් නිවැරදි උත්සාහය සිව්වැදෑරුම් වේ. එයින් දෙකක් ලියන්න.

(2) අන් අයගේ දියුණුව දැක සතුටු වීමත් අන් අය කෙරෙහි හිතවත් කමත් ප්‍රකට වන බඹ විහරණ දෙක ලියන්න.

(3) බිම්බිසාර රජතුමා හා විශාඛා සිටු දේවිය විසින් පූජා කරන ලද ආරාම දෙක නම් කරන්න.

(4) ''අනවජ්ජානි කම්මානි'' නිවැරදි රැකියාවක් කිරීම මංගල කරුණකි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ නිවැරදි රැකියා දෙකක් ලියන්න.

(5) සද්ධර්මරත්නාවලිය හා සැළලිහිණි සංදේශය යන කෘති දෙක ලියැවුණු යුග දෙක ලියන්න.

(6) තොලුවිල බුද්ධ ප්‍රතිමාවේ ආසනය හා මුද්‍රාව නම් කරන්න.

(7) ''පමණ දැන ආහාර වැළඳීමෙන් රෝගාබාධ අඩුවේ. සුව පහසුව ඇතිවේ.'' යන ඉගැන්වීම ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද? එය දේශනා කළේ කාහට ද?

(8) මිනිසුන් කුලයෙන් පහත්ව හා දුප්පත්ව ඉපදීමට හේතුවන අකුසල කර්ම දෙක ලියන්න.

(9) පරාභවයට හෙවත් පිරිහීමට හේතුවන පරාභව කරුණු දෙකක් ලියන්න.

(10) ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) ''සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිතතාවය හා අභිවෘද්ධිය වෙනුවෙන් මහ තෙරවරුන් බුද්ධ වචනය ඒකරාශි කොට සජ්ඣායනය කිරීම'' ධර්ම සංගායනා නම් වේ.

(1) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ආසන්න ම හේතුව ලියන්න. (ලකුණු 02)

(2) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

(3) සමාජ ගැටළුවක් විසඳා ගැනීමේ දී ධර්ම සංගායනා ක්‍රමය තේමා කරගත හැකි අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(03) ''හේතුවකින් උපදින ධර්මතාවයක් වේද ඒ හේතුව නැතිවීමෙන් එම ධර්මයාගේ නැතිවීම ද සිදුවන්නේ ය'' යනුවෙන් තථාගතයන් වහන්සේ වදාළ සේක. එය හේතුඵල ඉගැන්වීමයි. හෙවත් පටිච්ච සමුප්පාද ධර්මයයි.

(1) හේතුඵල දහම බුදුරජාණන් වහන්සේ මෙනෙහි කළේ බුද්ධත්වයෙන් කී වෙනි සතියේ දී ද? (ලකුණු 02)

Department of Education – Western Province

(2) හේතුඵල දහමේ සඳහන් වන අවිජ්ජා යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

(3) ''හේතුඵල ඉගැන්වීම ඇසුරින් පාසල් පරිසරය ඩෙංගුවලින් තොර පරිසරයක් බවට පත් කර ගතහැකි'' අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

(04) බුදු, පසේබුදු, මහ රහතුන් විසින් පුරුදු පුහුණු කළ යුතු ගුණ සමූහය බුද්ධකාරක ධර්ම නම් වේ.

(1) දස පාරමිතාවන්ගෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) එක් පාරමිතාවක් ආකාර තුනකින් සම්පූර්ණ කළ යුතු ය. එම ආකාර තුන නම් කර කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

(3) එක් පාරමිතාවක් නිදසුන් කරගෙන යහපත් සමාජයක් ගොඩ නැගීම උදෙසා පාරමිතා ධර්ම උපයෝගී කරගත හැකි අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) කොසොල් රට චාරිකාවේ දී කේසපුත්ත නියම්ගම් වැසියන්ට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

(2) යමක් නොපිළිගත යුතු ආකාරය දේශනා කරමින් කේසපුත්ත වැසියන්ට දුන් උපදෙස් දහයෙන් දෙකක් ලියන්න. (ලකුණු 03)

(3) ''මේ ක්‍රියාව කුසලයකි. නිවැරදිය, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දකි. මෙයින් මට උසස් දියුණුවක් කරා යා හැකි ය.'' යන අදහස්වලට එකඟ වෙමින් ඔබ ජීවිතය සාර්ථක කරගැනීමට කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) බෞද්ධයාගේ අත්පොත වන ධම්ම පදයෙහි බාලවර්ගයේ නව වන ගාථාව වන,

(1) තං ච කම්මං කතං සාධු..... යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(2) එම ගාථාවේ සිංහල අදහස ලියන්න. (ලකුණු 03)

(3) අද සමාජයේ මානසික ආතතියෙන් පෙළෙන බොහෝ දෙනෙකු තම දෛනික කටයුතු නිවැරදිව සිදුකර ගැනීමට පවා අපහසු තත්වයකට පත් වී ඇත. ඉන් මිදීමටත් ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව ජීවිතය ගත කිරීමටත් මෙම ගාථාවෙන් දෙන උපදේශය ආදර්ශ කොටගෙන කරුණු දක්වන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(1) දුටුගැමුණු මහ රජතුමා

(2) චතුරාර්ය සත්‍යය

(3) කෝට්ටේ සාහිත්‍ය යුගය

(4) සතර අගති (ලකුණු 5 × 2 = 10)

Department of Education – Western Province